**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය - 2024**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය යටතේ පනවා ඇති විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7හි 65ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිළිවෙලින් පිරිවැය රු.8,284,259ක් හා රු.12,509,438ක් වූ පුස්තකාල පොත් සහ අනෙකුත් වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට මේ වනවිට පියවර ගෙන ඇති අතර, එය ඉදිරි මූල්‍ය ප්‍රකාශනයන්හි නිවැරදි ලෙස සංශෝධනය කරන බව. | ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සියලුම ආයෝජනයන්ට අදාළ මුදල් ප්‍රවාහයන් ආයෝජන ක්‍රියාකාරකම් ලෙස හඳුනා ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද මුදල් උපලබ්ධි වීමෙන් ලද | නව ස්ථාවර තැන්පතු ආයෝජනය හා ස්ථාවර තැන්පතු උපලබ්ධි වීම කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ දක්වා ඇති අතර එය මීළඟ වර්ෂයේ දී ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීමට කටයුතු කරන බව. | තැන්පතු ආයෝජනයන් හා උපලබ්ධිවීම් වෙන් වෙන්ව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුදල්වලින් හිලව් කර ශුද්ධ අගය මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබූ අතර එම අගය දැක්වීමේදී රු.273,847ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | | |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ස්ථාවර තැන්පත් ආයෝජනයෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලද පොළී ආදායම රු.5,173,235ක් ලෙස දැක්විය යුතු වුවද රු.3,087,166ක් ලෙස දක්වා තිබුණි. | ආදායම් ප්‍රකාශය තුල දක්වා ඇති මෙම පොළී ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල ගැලපීම් යටතේ අඩු කර දක්වා ආයෝජන ක්‍රියාකාරකම් තුල පොළී ආදායම ලෙස එකතු කර ඇති බව. | පොළී ආදායම නිවැරදිව ගණනය කළ යුතුය. |
| (ඇ) | 2024 දෙසැම්බර් 31 දිනට අදාළ ලැබිය යුතු පොළී ආදායම රු.1,938,045ක් වුවද විගණනයේ ගණනය කිරීම් අනුව එය රු.1,551,805ක් වූයෙන් ලැබිය යුතු පොළී ආදායම රු.386,241ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ස්ථාවර තැන්පතු වලට අදාලව ගණනය කරන ලද ලැබිය යුතු ආයෝජන ආදායම රු.1,138,045 ක් වන අතර එම ආදායම ජංගම වත්කම් යටතේ දක්වා ඇති බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් වල රු.12,493,893ක ඌනතාවයක් තිබියදී හා සමුච්චිත අරමුදලේ හර අගයක් පැවතියදී ආයතනික සංවර්ධන අරමුදලට රු.4,510,602ක් මාරුකර තිබුණි. | සංවර්ධන අරමුදලට කරනු ලබන මාරු කිරීම අදාල පාඨමාලා ගිණුම්වලින් වියදමක් ලෙස දැනටමත් හඳුනාගෙන ගිණුම්ගත කර ඇති අතර එම අගය මූල්‍ය ප්‍රකාශන තුලින් වර්ෂයේ ශුද්ධ ලාභයෙන් කරන මාරු කිරීමක් ලෙස පෙන්වීම පමණක් සිදු කර ඇති බව. | ඌනතාවක් පැවතියදී අරමුදල් වෙනුවෙන් බැරකිරීම් නොකළ යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම<br>රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම<br>රු. | වෙනස<br>රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ආයෝජන වටිනාකම | 28,505,907 | 28,779,754 | 273,847 | ලැබිය ඇති පොළී ආදායම් ගැලපීමේ දී මෙම වෙනස ඇති වී ඇති බව. | ආයෝජන වටිනාකම නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී ශිෂ්‍යයන්ගෙන් ලැබිය යුතු පාඨමාලා ආදායම තුළ වර්ෂ 02 ක ඉක්මවූ රු.3,345,530ක ණය ශේෂ පැවති අතර, එය මුළු ණය ශේෂයෙන් සියයට 63ක් වුවද එම ණය අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර කළමනාකරණය විසින් ගෙන නොතිබුණි. | අගයෙන් වැඩි ප්‍රමාණයක් අදාල පාඨමාලාවන් හැරගිය ශිෂ්‍යයන්ගෙන් ලැබිය යුතු මුදල් වන බැවින් එම ආදායම් ඉවත් කර ගැනීමට කටයුතු කරන බව. | නොලැබෙන ආදායම් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 9(2)(ඊ), 10(5)(1) හා 11(අ) වගන්ති | අදාල අමාත්‍යවරයාගේ හා මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනී මකින් තොරව ආයතනය ඉපයූ ආදායම්වලින් රු.28,779,754ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | පාඨමාලා ආදායමින් ස්ථාවර තැන්පතු සිදුකර ඇති බව හා එම පොළී ආදායමින් අනෙකුත් අයභාර වියදම් හා ප්‍රාග්ධන වියදම් පියවා ගන්නා බව හා මෙම කාර්යය රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාර සිදුකරනු ලබන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | විභාග පැවැත්වූ දින සිට මාස 03ක කාලයක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතු බවට නියම කර ඇතත්, 2023 සිට 2024 වර්ෂය දක්වා පවත්වා තිබූ විභාග 37ක ප්‍රතිඵල නිකුත් කිරීම මාස 03 ඉක්මවා මාස 02 සිට මාස 17 ක දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. | විභාග පත්‍ර අධීක්ෂකවරුන් කොළඹින් පිට සිටීම නිසා කාලය ගත වීම, අනධ්‍යයන කාර්යමණ්ඩලයේ වැඩ වර්ජනය, සිසුන් ඔවුන්ගේ පැවරුම් හා ව්‍යාපෘති වාර්තා භාර දීම ප්‍රමාද වීම යනාදී කරුණු බලපෑ බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 3.1 | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් හතර දෙනෙකුගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.20,842,876ක් ගෙවා | පැමිණීම හා පිටවීම පිළිබඳ පොදු ක්‍රමවේදයක් පිළිබඳව යෝජනා ඉදිරිපත් කරන ලෙස උප කුලපතිවරුන්ගේ කමිටුවට (CVCD) දන්වා ඇති අතර තවමත් එවැනි ක්‍රමවේදයක් පිළිබඳ ව අප වෙත දන්වා නැත. ඒ අනුව | ආයතන සංග්‍රහය හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | තිබුණි. | ඉදිරියේ දී කටයුතු කරන අතර එතෙක් පැමිණීමේ ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර ඇති බව. | |
| (ඇ) | 2022 ජනවාරි 03 දිනැති අංක 01/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | පුස්තකාල පොත් වාර්ෂිකව සමීක්ෂණය කළ යුතු වන අතර වාර්තා කඩිනමින් විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත් 2024 වර්ෂයට අදාළ සමීක්ෂණය සිදුකර නොතිබුණි. | මූලික සමීක්ෂණ කටයුතු අවසන් කර ඇති අතර එහි වාර්තාව අධීක්ෂණ කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව හා 2025 ජුනි මස තුළ තොග සමීක්ෂණ ක්‍රියාවලිය අවසන් කළ හැකි බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,493,893ක ඌනතාවයක් වූ අතර රීට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,638,250ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,855,643ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වෙනත් ආදායම් රු.3,280,655කින් අඩුවීම, මෙහෙයුම් වියදම් රු.5,511,961කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේ සිට සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු එකතුව රු.163,533ක් වූ ණය ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | අදාල ලියකියවිලි සම්පූර්ණ කර එවා නොමැති බැවින් අදාල මුදල් ආයතනයට ලබා ගැනීමේ ගැටළුවක් පවතින බව හා මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් නැවත පැහැදිලි කිරීමක් ලබා ගැනීමට කටයුතු කරන බව. | ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2009 අගෝස්තු 27 දින ලබාදී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ගුරු සේවා ව්‍යවස්ථාවට ගුරු පුස්තකාලයාධිපති පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හා ගුරු පුස්තකාලයාධිපති ශාස්ත්‍රපති පාඨමාලාව ඇතුළත් කළ යුතු වුවද අධ්‍යාපන අමාත්‍යාංශය රීට අදාළ කටයුතු සිදුකර නොතිබීම හේතුවෙන් 2014 හා 2019 වර්ෂයන්හි | ආයතනය මගින් පැවත්විය හැකි පාඨමාලා ගුරු පුස්තකාල විෂයට පමණක් සීමා නොවන අතර නියමාවලියෙන් ලබා දී ඇති බලතල අනුව දැනට පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාවේ සිට ආචාර්ය උපාධිය දක්වා පාඨමාලා 10ක් පමණ NILIS ආයතනය | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සිට යථෝක්ත පාඨමාලා අත්හිටුවා තිබූ නමුත් අධ්‍යාපන අමාත්‍යාංශය හා සම්බන්ධීකරණයන් කර ගුරු ව්‍යස්ථාවට යථෝක්ත පාඨමාලා ඇතුලත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විසින් පවත්වනු ලබන බව, ගුරු සේවා ව්‍යවස්ථාවේ මෙම වෙනස්කම් සිදු කිරීමට 2009 අගෝස්තු මස 27 දින අමාත්‍ය මණ්ඩල තීරණය මේ වන තෙක් ක්‍රියාත්මක වී නොමැත. 2012 අගෝස්තු 16 දින සහ 2014 සැප්තැම්බර් 12 දින වල දී පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කමිටු (COPE) රැස්වීම්වලදී ද මේ පිළිබඳ සාකච්ඡා කර අදාළ ගැටලුව ඉක්මනින් විසඳන මෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට වරින් වර දැනුම් දී ඇතත් සාධනීය පියවරක් ගෙන නොමැති බව, මේ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය සහ අනෙකුත් අදාල පාර්ශවයන් නැවත නැවත දැනුවත් කිරීම සහ සාකච්ඡා තුළින් ඒ සඳහා මැදිහත් වී කටයුතු කිරීමේ වගකීම අප අයතනය මගහැර නොමැති බව. | |
| (ඇ) | වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව භෞතික/ දෘශ්‍ය පරිසරය වැඩිදියුණු කිරීම සඳහා වැසිකිළි අලුත්වැඩියාව, සිවිලිම අලුත්වැඩියාව, වෙනම විදුලි මීටරයක් සවි කිරීම යන ක්‍රියාකාරකම් වලින් වර්ෂය තුල සියයට 25 ක කාර්යසාධනයක් ළඟා කර ගැනීමටත්, සමාජ වගකීම ඉටු කිරීම සහ ජාතික හා ජාත්‍යන්තර දාශ්‍යතාව සහතික කිරීම යන ඉලක්ක වෙත ළඟාවීමට ජාතික වෘත්තීය සංවිධානය සමඟ ජාල සංවර්ධනය කිරීම, බාහිර සංවිධාන සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, වෙබ් අඩවි හා සමාජ මාධ්‍ය හරහා ආයතනයේ පැවැත්ම ශක්තිමත් කිරීම යන ක්‍රියාකාරකම් සිදුකරලීමටත් අපේක්ෂා කර ඇති නමුත් ඊට අදාළ ක්‍රියාකාරකම් කිසිවක් සිදු වී නොතිබුණි. තවද, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ පනත සංශෝධනය කටයුතු සියයට 50 ක් සම්පූර්ණ කර ගැනීමට සැලසුම් කර තිබුණද ඒ සඳහා කමිටුවක් පත්කර ගැනීම පමණක් සිදුකර තිබුණි. | මෙම කටයුතු ඉදිරියේදී ඉතා ඉක්මනින් ඉටුකිරීමට කටයුතු කරන බව. | ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |